# අනාගත මිනිස් බල අවශ්‍යතා

ආර්ථික විද්‍යාඥයින් සහ වෙනත් සමාජ විද්‍යාඥයින් පස් අවුරුදු සහ දස අවුරුදු සැලසුම් පිළියෙල කිරීමෙහි ඉතා ගැඹුරු ලෙස ව්‍යාවෘතව සිටින විට විශේෂඥයින් අත තැබීමට පවා බියවන වසර 25 සිට 50 දක්වා කාලයක් සඳහා සැලසුම් කිරීම පිළිබඳව සිතා බලමු.

ඕනෑම සමාජයක වැඩිදෙනා බෙහෙවින් කල්පනා කරන්නේ 'හෙට' ගැනය. ඊළඟ සතිය හෝ මාසය ගැන සිත් යොමු කරන්නේ ඊටත් වඩා අඩු සංඛ්‍යාවකි. ඊළඟ වර්ෂය ගැන සිත් යොමුකරන සංඛ්‍යාව ඊටත් අඩුය. අවුරුදු දහයකින් සිදුවිය හැකි තත්ත්වයක් ගැන සිතන මතන අය අතලොස්සක් පමණ විය හැකිය. එවැනි පුද්ගලයින් සොයාගැනීම ද අපහසුය. එම නිසා ඊළඟ ශතවර්ෂය ගැන සිතන මතන අය දුර්ලභ ගණයේ පුද්ගලයින් විය හැකි බව කිවමනා නොවේ.

මේ ආකාරයෙන් බලන කල ඕනෑම සමාජයක වැඩි දෙනා කල්පනා කරන්නේ තමාට සමීපම වූ පරිසරය, තම නිවස හෝ තමාගේ සේවා ස්ථානය සම්බන්ධයෙනි. තමාගේ ගම හෝ නගරය ගැන සිතීමට වේලාව සොයා ගත හැකි සංඛ්‍යාව ඉතාමත් අල්පය. තමා ජීවත්වන දිස්ත්‍රික්කය හෝ පළාත හෝ ගැන සිතන සංඛ්‍යාව ඊටත් වඩා අඩුය. මේ අනුව බලන කල තමාගේ රට ගැන සිතන තැනැත්තා ද දුර්ලභ ගණයේ පුද්ගලයෙකි. ''මෝඩයින්ගේ දෙනෙතට ලෝකයේ කෙළවර පෙනේ'' යයි කියමනක් ඇතැම් සමාජයන්හි තිබීම මේ අනුව පුදුමයක් නොවේ. විශේෂයෙන් ම සමාජ ප්‍රපංචයන්ගේ ඉහළ ගතිකත්වය නිසා අනාගතය පිළිබඳව අනාවැකි කීමේ විද්‍යාව ද ජෝතිර් විද්‍යාව මෙන් අවදානම් සහිත විද්‍යාවකි. ඇතැම් සමාජයන් ක්‍රමිකව වෙනස්වන අතර, වෙනත් සමහර සමාජයන්හි විප්ලව හටගෙන නව සමාජයක් බිහිවීමට මඟ පාදමින්, මුළු සමාජ ක්‍රමයම වෙනස් කරයි. එවැනි අවස්ථා වල දී, මා ඕ සේතුං නිරීක්ෂණය කළ අන්දමට ''රටක සිතියමක දක්නට ලැබෙන රේඛා සියල්ල ම මකාදමා අලුත් රේඛා අඳිනු ඇත.'' සිදුවන විපර්යාසයන් ඇසට නොපෙනෙන්නා වූ සමාජයන් ඇති අතර, එවැනි සමාජයන්හි ජීවිතය බොහෝදුරට ඒකාකාරී ස්වභාවයක් උසුලයි. අපේ මේ කුඩා රටේ මීළඟ ශතවර්ෂයේ දී මේ මේ දේ සිදුවේයයි අපට කල් තියා සැලසුම් කළ හැකි වන්නේ කෙසේ ද? අද ශ්‍රී ලංකා ජන ජීවිතයේ බොහෝ අංශයන්හි නොයෙකුත් වෙනස්වීම් සිදුවන වේගය හා අවිනිශ්චිතතාවය අනුව බලන කල, අනාගතය සඳහා සැලසුම් පිළියෙල කිරීම බැරෑරුම් කාර්යයකි. එසේ නැත්නම් ඉතාමත් අසීරු කාර්යයකි. මෙම ප්‍රශ්නය මැඩපවත්වාලීම සඳහා අනාගතය සඳහා වන සැලසුම් බොහෝ විට විවිධ උප කල්පනයන් පදනම් කර පිළියෙල කෙරේ. මේ උපකල්පන වලින් සමහරක් යථාර්ථවාදී වන අතර සෙසු උපකල්පන එසේ නොවනු ඇත. උපකල්පනයන් දුර්වල නම් මුළු සැලැස්ම ම බිඳ වැටේ. මේ දුෂ්කරතාවන් සිතෙහි තබාගෙන, මීළඟ ශත වර්ෂයේ සමාජයන් කෙබඳුදැයි තුන් ආකාරයකින් සිතා බැලීමට මෙහි දී උත්සාහයක් දැරේ. පළමුකොට, රුවලක් නැති නෞකාවක් ලෙස පාවී යාමට ඉඩ හරින සමාජයක් පිළිබඳ කෙනෙකුට සිතිය හැකිය. ඒ අවස්ථාවේ දී සමාජයට හිතකර හෝ අහිතකර විය හැකි, පවත්නා සමාජ බලවේගයන් දිගට ම ක්‍රියාත්මක වනු ඇත. එවැනි සමාජයන්හි නායකයින්, නොදන්නා ගමනාන්තයක් කරා යන ගමනක නිරීක්ෂකයන් වනු ඇත. පාවී යාමට ඉඩහැර ඇති සමාජයක අහිතකර බාහිර බලවේගයන් අවශෝෂණය කරගැනීමට ඇති අනතුරුදායක තත්ත්වය හෝ වනචාරී යුගයේ නීතිරීතිවලට ආපසු ගමන් කිරීමේ අනතුරු හෝ සැමකල්හි ම පවතී.

අනාගත දියුණුව කරා ගමන් කිරීමට ඇති රටකට දෙවෙනි මාවතක් ද තිබේ. නායකයින්ගේ අදහසේ හැටියට සමාජයේ පොදු සුභසිද්ධිය සඳහා අහිතකරයයි හැඟෙන ඇතැම් සමාජ උපනතීන් ක්‍රමයෙන් හැඩගැස්වීමෙන් මෙය කළ හැකිය. ජනගහණය වේගයෙන් වැඩිවේයයි ඇති වූ බිය නිසා ජනගහණ වර්ධනය පාලනය කිරීමේ ඵලදායී ක්‍රම මෑත අතීතයේ දී නිර්මාණය කරන ලදී. 1950 ගණන්වල දී 2.8 ක් වූ අප රටේ ජනගහණයේ වර්ධන අනුපාතය 1980 ගණන්වල දී 1.8 කට පමණ අඩුකර ඇත. එය තවත් අඩුකිරීමට කඩිනම් ව්‍යාපාරයක් ගෙනයනු ලැබේ. මෙවැනි උපනතීන් පදනම් කොට මීළඟ ශත වර්ෂයේ ජනගහණය ඉහළ, මැදි හා පහළ සැළසුම් අනුව පුරෝකථනය කිරීමකට ජනගහණ විශේෂඥයින් සූදනම් වෙති. 1 වැනි සංඛ්‍යා සටහනෙන් නිරූපනය වන අන්දමට ක්‍රි.ව. 2000 වන විට, ශ්‍රී ලංකාවේ ජනගහණය දෙකෝටි 18 ලක්ෂයක් ද ශ්‍රම බලකාය ලක්ෂ 91 1/2 ක් පමණ ද වනු ඇත.

1 සංඛ්‍යා සටහන
ජනගහන හා ශ්‍රම බලකාය දක්වන ප්‍රක්ෂේපනය
(ජනගහනය දශලක්ෂ වලින්)

| | | 1981 | 1991 | 2001 |
|---|---|---|---|---|
| ජනගහණය | ... | 15.83 | 19.89 | 21.79 |
| ශ්‍රම බලකාය | ... | 5.95 | 7.54 | 9.15 |

ජනගහණයේ ප්‍රමාණය සමාජයේ එක් ලක්ෂණයක් පමණක් යයි කීම අවශ්‍ය නොවේ. රටක අනාගත තත්ත්වය තීරණය කරනු ලබන්නේ මිනිසුන්ගේ සංඛ්‍යාවෙන් පමණක් නොව ඔවුන්ගේ ගුණාත්මක ලක්ෂණද සැලකිල්ලට ගනිමිනි. අනාගත සමාජය දෙස බැලිය යුත්තේ, සමස්ථ සංකල්පයක් ලෙසිනි. එක් අංශයක ඇතිවෙන වෙනසකින්, අනෙක් අංශවලට යම් ප්‍රතිඵල ඇතිවිය හැකි අතර, ඇතැම් විට එයින් හිතකර හෝ අහිතකර ප්‍රතිඵල ඇති විය හැකිය. මේ ප්‍රවේශය අනුගමනය කළහොත්, එයින්, පූර්වතාවන් මිශ්‍ර වූ කලබලකාරී සමාජයක් ඇතිවේ.

රටක අනාගත තත්ත්වය උදෙසා සැලසුම් කිරීමේ තුන් වැනි මාර්ගය, එරට සමාජ, සංස්කෘතික, ආර්ථික හා පාරිසරික යථාර්ථයන් පදනම් කොටගෙන, ඒ රටට උචිතයයි සිතෙන සමාජයක් බිහිකිරීම සඳහා ඉතා ඕනෑකමින් ම උත්සාහ කිරීමයි. මෙම මාර්ගය අනුගමනය කිරීමට කැමැති අය අසන

ප්‍රශ්න එනම්, 21 වැනි ශතවර්ෂයේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ සඳහා අපට තිබිය යුත්තේ කුමන වර්ගයේ සමාජයක්ද යන්නයි. එය ''ස්වයංපෝෂිත මෙන්ම ආත්මගරුත්වයකින් යුතු ඉඩම් හිමි ගැමියන් රාශියකින් සමන්විත විය යුතු එකක්ද? එසේ නොමැති නම්, පරිගණක යුගයකට අයත්වන ශක්ති සම්පන්න ස්වයංක්‍රිය පිරිසකින් සමන්විත සමාජයක්ද? අපගේ සිතුවිලි ක්‍රියාවට පරිවර්තනය කරනවිට, මිනිස්බල අවශ්‍යතා පිළිබඳ ප්‍රශ්න පැන නැගේ. මිනිස් බලය අවශ්‍ය වනුයේ රටේ නායකයින්ගේ දර්ශනය සැලසුම් කරන සමාජයක් ගොඩනැගීම සඳහා පමණකි. මෙකී තුන්වැනි මාර්ගය අනුගමනය කෙරේ නම් සමාජය සියුම් ලෙස හැඩගැස්වීමට සිදුවනු ඇත. විශේෂඥ උපදෙස් හා විදේශාධාර ලැබීම හේතුකොට අගතිගාමී වූ සමාජයක හෝ විවිධ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ විසින් පිළියෙල කරනු ලැබූ සැලසුම් පදනම් කරගෙන ඇති වූ සමාජයන්හි මිනිස් ජීවිතයන්හි ඇතැම් අංශ සඳහා ආවට ගියාට හෝ ඉඳහිට කරන වෙනස් කිරීම් මීට ඇතුළත් නොවේ. මෙහි දී ඇත්ත වශයෙන් ම, ජාතික ආචාර විධි ගැන ගැඹුරු අවබෝධයක් ඇති ජනනායකයින් සමාජයට නායකත්වය දෙනවාට වඩා, කාලයක් තිස්සේ අත්හදබැලූ න්‍යායන් හෝ විඥනවාදයන් මාර්ගෝපදේශකත්වයෙහි ලා යොදගෙන සමාජය ගොඩනගනු ඇත. ''අර යන්නේ මගේ රටවැසියන්; මම ඔවුන් පසුපස ගමන් කරමි'' යි වරක් කීවේ මහත්මාගාන්ධි තුමා ය. අපට ඇති විකල්ප තුන අතුරෙන්, එනම් සමාජයකට පාවියාමට ඉඩහැරීම හෝ සමාජයේ ඇතැම් අංශ ක්‍රියාත්මක කිරීම හෝ අනාගතය සහ අපේක්ෂිත සමාජය දූරදර්ශී ලෙස සැලසුම් කිරීම යන තුනෙන්, අප රට විසින් අනාගතය සඳහා අනුගමනය කළ යුත්ත කුමක් ද? මීළඟ ශත වර්ෂය සඳහා වන මිනිස්බල අවශ්‍යතාවන් අනිවාර්යයෙන් ම තීරණය වනු ඇත්තේ මේ අනුව තෝරාගනු ලබන මාවත අනුවය.

පළමුවැනි මාර්ග දෙකෙන් එකක් අපරට විසින් අනුගමනය කරනු ඇතැයි සිතතොත්, මීළඟ ශත වර්ෂයේ ග්‍රාමීය ජන ගහණය සම්බන්ධයෙන් වන අපගේ සැලසුම් කෙසේ විය යුතුද? ලොවේ සැම තැන්හිම දක්නට ඇත්තේ, වැඩි වැඩියෙන් නාගරික පෙදෙස් දියුණු කිරීමයි. නොයෙකුත් අංශයන්ගෙන් විශිෂ්ටත්වයක් දක්වන අපගේ මේ කුඩා රටෙහි, නාගරික ජනගහණ අනුපාතයේ සුළු අඩුවීමක් තිබිණි. 1971 දී 22.48% ක් වූ එය 1981 දී 21.50% දක්වා අඩු වී ඇත. මෙම අඩුවීමට තුඩුදුන් හේතු බොහෝ ය. එමෙන් ම විවිධාකාරය. නගරවලින් ජනයා නික්මයාම, ඉඩම්වල අගය වැඩිවීම, නාගරික පෙදෙස්වල ජීවන වියදම, ඉඩම් සංවර්ධන ආඥපනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ ''හරිත තරංගයන්ගේ'' බලපෑම මීට තුඩු දුන් හේතු වශයෙන් බොහෝ විට ගෙනහැර දක්වනු ලැබේ. හේතුව කුමක් හෝ වේවා, නගර ඇති කිරීමේ ක්‍රියාවලිය අප රටේ වෙනස් නොවී එකම තත්වයේ ම පවතින බව පෙනෙන්නට තිබේ. ඊළඟ ශත වර්ෂය සඳහා අප සිතා බැලුවහොත් හෝ මෙම තත්ත්වය එසේ ම පවතිනු ඇතැයි සිතිය හැකිවේද? නැතහොත්, අප රට වැසියන්ගෙන් බහුතරය, ගැමි තත්ත්වයෙහි ම සිටිනු ඇත්දැයි සිතිය හැකිවේද? එසේ ම වී වගාවෙහි නියැලී මිනිසුන්ගේ සංඛ්‍යාවෙහි මෑත අතීතයෙහි තරමක අඩුවීමක් තිබිණ. මෙහිදී ද වැඩිවැඩියෙන් යාන්ත්‍රික ක්‍රම භාවිතය, බාල පරම්පරාව කුඹුරු ගොවිතැන් කටයුතුවලට ඇති අකමැත්ත ආදී හේතු කිහිපයක් ගෙනහැර දැක්විය හැකිය. සහලින් ස්වයංපෝෂිත වීමත් සමගම, මේ තත්ත්වය අපගේ සමාජ රටාවට ඇබ්බැහි වී, මීළඟ ශතවර්ෂය වන විට, අපගේ ගැමි ජනතාවගෙන් ඉතා සුළු පිරිසක් පමණක්, වී ගොවීන් වනු ඇත.

මෙරට ජනගහණයෙන් 25% කට වැඩි පිරිසක්, ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ, ඉඩම් සංවර්ධන ආඥපනත අනුව වෙන්කර දෙන ලද ඉඩම් කට්ටිවල ද කොලනි සහ වෙනත් ජනාවාස යෝජනාක්‍රම යටතේ දෙන ලද ඉඩම්වල ද පදිංචිව සිටිති. මෙකී ඉඩම්වලින් වැඩිහරියක් කොටස්වලට කැඩීම හෝ අනුප්‍රාප්තිකයන් එක් කෙනෙකුට වැඩි සංඛ්‍යාවකට පැවරීමට හෝ නොපුළුවන. මේ අනුව මෙම ජනපදවල දෙවැනි පරම්පරාවේ අනාගතය කෙබඳු විය හැකි ද? මෙම පෙදෙස්වල කෘෂිකාර්මික කටයුතුවල මෙම විශාල සංඛ්‍යාවකට රැකියා ලබාදිය හැකිද? ඌව පළාතේ ඇතැම් පෙදෙස්වල ඇති තොරතුරු අනුව බලන විට ඒ පෙදෙස්වල සිටින හේන් ගොවීන්ගෙන් සැහෙන පිරිසක් ජනපදවල දෙවැනි පරම්පරාවට අයත් වූවන් යැයි පෙනේ. මෙම ජානපදිකයන්ගේ දෙවැනි පරම්පරාවට අයත් අයගේ සහ වෙනත් ගම්බද තරුණයන්ගේ අද බලාපොරොත්තු කෙබඳු ද යත් කෘෂි ඉඩම්වලින් ඈත්ව යාමට ඔවුන් වැඩි කැමැත්තක් දක්වන බව පෙනේ. එහෙත් ඔවුන්ට කොයිබ යා හැකිද? ග්‍රාමීය කර්මාන්ත දියුණු කිරීම ද බලාපොරොත්තු සඵල වන්නක් නොවන බව ද පෙනීගොස් ඇත. ජනාකීර්ණ තෙත් කලාපයෙන් ජනතාව වෙනත් පෙදෙස්වලට ගෙන යාමෙන් ග්‍රාමීය තෙත් කලාපයේ ඇති ජනගහණ පීඩනය අඩුකිරීමට සමත්වී නැති බව ඇතැම් උගත්තු පෙන්වා දෙති. වතු අංශය සමග සසඳා බලනවිට, (මුලු ජන ගහණයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ) ග්‍රාමීය අංශයේ සේවා වියුක්තිය දෙගුණයක් පමණ විශාල ය.

මෙම තත්ත්වය වැඩිපුරම දක්නට ඇත්තේ ගැහැණු පිරිමි යන දෙකොටසෙහි ම අවුරුදු 14–25 වයස් කාණ්ඩ අතරය. ඵලදයි විසඳුමකින් තොරව මෙම තත්ත්වය දිගට ම පැවතුන හොත් එ මගින් අයහපත් දේශපාලන වාතාවරණයක් ඇතිවිය හැකිය.

තුන්වැනි විග්‍රහ ක්‍රමය වඩාත් උචිතය. එවැනි යුටෝපියානු විග්‍රහයක් මගින් සමාජයේ සියළුම රෝගවලට ''සර්වරෝග නිවාරකයන්'' සපයන බවක් එමගින් නොහැඟෙයි. එක්රැස් කොට ගත් මිනිස් අත්දැකීම් සම්භාරය ශත වර්ෂ 25 ක් පමණ ඈතට දිවෙන රටක ඊළඟ ශතවර්ෂයෙහි ආදර්ශය හෙළිකර ගැනීමේ දී පරිසරෝචිත සමාජයෙහි පදනම හෙළිකර ගැනීමෙහි අවශ්‍යතාවයක් පවතී. මෙම කාරණයෙහි දී දේශීය සම්ප්‍රදයෙහි හා සංස්කෘතියෙහි සාමාජිකයන් ලෙස ග්‍රාමීය ජනතාව හැමවිට ම සැලකිය යුතු ක්‍රියාකලාපයක් ඉටුකොට ඇති බව සඳහන් කළ යුතුය. වාරිමාර්ග ශිෂ්ඨාචාරය දෙස විමසිලිමත් වන විට එවැනි සමාජයක මිනිස් බල අවශ්‍යතා පුරුෂාර්ථයන් කීපයක් වටා බෙහෙවින්ම සංවිධානය වි ඇති බව කෙනෙකුට දැකිය හැකිය. එවැනි සමාජයක් පූර්වතාවයන් නිවැරදිව තෝරා ගෙන ඇති අතර එහි අවසාන පරමාර්ථය වූයේ හැකි ඉහළ ම මානසික සුවය අත්පත්කර ගැනීමයි. අනෙක් සියළු දෙයටම ලැබුණේ ඊට වඩා අඩු වැදගත්කමකි. ආනන්ද



කුමාරස්වාමි මහතා ඔහුගේ සම්භාවනීය කෘතියක් වන "මධ්‍ය කාලීන සිංහල කලා නමැති ග්‍රන්ථයෙහි භෞතික සුඛ විහරණයෙන් අනූන ඔහු ජීවත් වන සමාජයෙහි සුඛ විහරණයට වඩා නුවර යුගයේ මූර්ති ශිල්පීන් ශෝභන ලලිත කලා නිර්මාණය කළ සමාජයෙහි සුඛ විහරණය ශ්‍රේෂ්ඨ බවට තර්ක කොට ඇත. හුණු කිල්ලෝටයක්, රිදී බත්දේසියක්, පිහියාමිටක්, දෙරපියස්සක් නිම කිරීමට සතියක් හෝ මාසයක් ගත කළ නුවර යුගයේ ග්‍රාමීය කැටයම්කරුවකුට එය ඉක්මණින් නිම කිරීමේ අවශ්‍යතාවයක් නො වූ අතර එ මගින් ඔහුට මහත් තෘප්තියක් ලබාගත හැකි විය. නූතනයෙහි මහා පරිමාණ නිෂ්පාදන ජීවිතය කොතරම් කලබලකාරී ද යත් එවැනි ම මානසික සුවයක් අත්කර ගැනීම උගහටය. නූතන සමාජය උසස් සුඛ විහරණයක් අත්කර ගැනීමේ පරමාර්ථයට මූලිකත්වයක් දෙන්නේද? යනුවෙන් කෙනෙකුට මෙහි දී ප්‍රශ්න කළ හැකිය. ඊළඟ ශතවර්ෂය සඳහා ග්‍රාමීය සමාජය සැලසුම් කරන්නන් අවසාන පරමාර්ථය වශයෙන් ඉහළ මානසික සුවයක් හා ප්‍රීතියක් අත්කර ගැනීම පිළිබඳව දැඩි සැලකිල්ලක් දක්වන්නේ ද ? කිසිවෙක් එතෙක් දුරට සැලසුම්කොට ඇතැයි සිතීමට අපහසුය. රාජකීය ආසියානු සංගමය මගින් මාදුරුඔය බිසෝකොටුවේ ආරම්භය පිළිබඳව පැවති සාකච්ඡාවේදී එය යක්ෂයන් නිර්මාණය කළ බවට මත පළ විය. එහෙත් එම යක්ෂයන් කෑවේ මස් ද බත් ද යනුවෙන් අසමින් එම අදහස උපහාසයට ලක්විය. පැරැන්නන්ගේ ප්‍රධාන ආහාරය බත් වූ බැවින් ඔවුන්ට මෙම සියළුම ජලාශ හා වාරිමාර්ග නිර්මාණය කිරීමට සිදුවිය. එම නිසාම පවත්නා මිනිස් බලය වාරිමාර්ග තාක්ෂණය තුළ හැසිරවීමට සිදු විය. අද පවත්නා පරිදි මිනිස් බල ඇගයීම හා මානව සම්පත් සංවර්ධනය විශේෂිත හැකියාවන් සඳහා පවත්නා ඉල්ලුම මත පදනම්ව කෙටිකාලීන අපේක්ෂාවන් මත දැඩිලෙස සංකේන්ද්‍රනය වී තිබේ. එනම් රටේ විවිධ පළාත්වල විවිධ හැකියා මට්ටම්හිදී ශ්‍රමයෙහි ඉල්ලුම හා සැපයුම හඳුනා ගැනීම හෝ සංවර්ධන සැලසුම් හා විදේශ වෙළෙඳ පොළ සඳහා ඇති ඉල්ලුමට සාපේක්ෂව වර්තමාන හා අනාගත මිනිස්බල අවශ්‍යතා තක්සේරු කිරීමයි. එසේ වුව ද මිනිස්බල සම්පත් ඇතිවූයේ කෙසේද යන ප්‍රශ්නය ආරම්භක තත්ත්වයෙහි ම පවතී. මූලික වශයෙන් මිනිස්බල අවශ්‍යතා අගැයීම අකර්මන්‍ය හෝ සීමා කළ යුතු ද? ඉල්ලුමක් පවත්නේ නම් ඒ සඳහා පුහුණු කළ යුතු ද යන තර්කය පිළිපැදිය යුතු ද? මිනිස්බල අවශ්‍යතා සමහර අරමුණු අත්කර ගැනීම සඳහා නොපෙළඹවිය ' යුතු ද? බ්‍රිතාන්‍ය දිසාපතිවරයෙකු වූ ඒ. ඩී. බ්‍රොඩි 1850 දී අනුරාධපුරයේ දරුණු පහරදීම්, මංකොල්ල කෑම් හා මිනීමැරුම් ගැන දැන ගැනීමට නොලැබුණු බව වාර්තා කොට ඇත. එමෙන් ම ඔහු සේවය කළ වර්ෂ තුනක කාලය තුළ කිසිම පුරවැසියෙකුට දූෂණ කටයුතු සඳහා දඬුවම් දීමට සිදු නොවූ බවද වාර්තාකොට ඇත. එවැනි සමාජයක පොලිස් නිලධාරීන් ගේ හෝ නීතිඥයන්ගේ අවශ්‍යතාවය සීමාවෙයි. ඉංග්‍රීසි ජාතිකයන් මහනුවරට පැමිණීමට පෙර නුවර ඇසළ පෙරහැර පවත්වන ආකාරය වාර්තා කරන ජෝන් ඩේවි දින ගණනාවක් පෙරහැර පැවැත්වුව ද සමාජයේ සෑම කොටසකට ම අයත් මිනිසුන් විශාල සංඛ්‍යාවක් රැස්වුව ද කිසිවිටක සාමය කඩවීමේ අවස්ථාවක් උදනොවූ බවත් ආරක්ෂක නිලධාරීන් දක්නට ලැබුණේ කලාතුරකින් බවත් දක්වා ඇත. එවැනි සමාජයක ආරක්ෂක සේවා සඳහා මිනිස්බල පුහුණුකිරීම අදාළ නොවන තරමය. එම නිසා නූතන සමාජයේ මිනිස්බල අවශ්‍යතා බොහෝ දුරට ඔවුන්ගේ අදූරදර්ශීකම හා අනාගතය පිළිබඳව මනාලෙස සැකසූ දර්ශනයක් නොමැතිකම නිසා කෘතිමව මවා ගත්තත් ලෙස තර්ක කළ හැකි ද?

මහාචාර්ය
**සී. එම්. මද්දුම බණ්ඩාර විසිනි**